බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2017

---------------------------------------------------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 17(2) වගන්තිය හා 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් වරට ලබාගත් වැටුප පදනම් කරගෙන පාරිතෝෂික වෙන්කිරීම් සිදුකල යුතු වුවද ඊට පටහැනිව 2018 ජනවාරි මාසයේ වැටුප් පදනම් කරගෙන පාරිතෝෂික ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් රු.43,487 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) 2015 ඔක්තෝබර් 14 දින නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මගින් විද්‍යායතනයට ලබාදී තිබූ භාණ්ඩ අයිතම 40ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2015 ජනවාරි සිට 2017 මැයි දක්වා කාලපරිච්ඡේදයට අදාලව සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් නොගෙවීම හේතුවෙන් නියම කරන ලද එකතුව රු.867,477 ක අධිභාර ගෙවිය යුතු වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය විසින් 2015 ජූලි 02 දින මිලදී ගෙන තිබූ රු.1,916,590ක් වටිනා පරිගණක 18ක් විද්‍යායතනයේ භාෂා විද්‍යාගාරයක් (“MINI ” Language Laboratory) ස්ථාපිත කිරීම වෙනුවෙන් නිකුත් කල බවට ව්‍යාපෘතිය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද වත්කම් උපලේඛණයේ දක්වා තිබුණද එම පරිගණකවල භෞතික පැවැත්ම විගණනයේදී තහවුරුකර ගත නොහැකි විය.

## 2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 135 | එක් එක් ගනුදෙනුව නිළධාරීන් කීපදෙනෙකුගේ පරීක්ෂණයට භාජනය වන පරිද්දෙන් මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් කීපදෙනෙකු අතර බෙදා නියම කල යුතු බව දක්වා තිබුණද, විද්‍යායතනයේ කළමනාකරණ සහකාර නිලධාරිනියන් දෙදෙනෙකු සිටියදී වවුචර් පිළියෙල කිරීම, මුදල් පොතෙහි සටහන් තැබීම, චෙක් පත් ලිවීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම, සුළු මුදල් කටයුතු කිරීම යනාදී කටයුතු එක් නිලධාරිනියක විසින් ඉටු කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 454 | භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් බඩු වට්ටෝරු පොතක් එක් එක් අංශය තුල පවත්වාගෙන යා යුතු වුවද විද්‍යායතනයේ ඉදිකිරීම් තාක්ෂණය, කෘෂි යන්ත්‍ර තාක්ෂණය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය යන විද්‍යාගාරයන්හි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් බඩු වට්ටෝරු පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 7 වගන්තිය | විද්‍යායතනය මුද්දර ගාස්තු සඳහා සමතයකට පත් කිරීමේ අධිකාරියක් වශයෙන් ලියාපදිංචි කර තිබූ නමුත් අදාල මුද්දර ගාස්තු සමතයකට පත්කර එම ගාස්තු අදාල කාර්තුව අවසානයේ සිට දින 15 ක් ඇතුළත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) 5, 6 ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලාවන් පවත්වන මෙම විද්‍යායතනයේ ගෙවීම් කිරීමේදී, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන ජාතික මට්ටමේ විශ්වවිද්‍යාල හා සම තත්වයේ සලකා එම විශ්වවිද්‍යාලවලට අදාලව නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව ගෙවීම් කල නොහැකි වුවත්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවාගැනීම සඳහා තෝරා ගැනීමේ කමිටු සාමාජිකයන්ට එක් අයෙකුට රු.1000 බැගින් රු. 47,000 ක්ද ප්‍රවාහන ගාස්තු ලෙස රු. 21,000 ක්ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2011 මාර්තු 18 දිනැති චක්‍රලේඛ අංක 954 පදනම් කරගෙන ගෙවීම් කර තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, විද්‍යායතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 4,130,240 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ජුනි 01 දින සිට දෙසැම්බර් 31 කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 2,775,099 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,905,339 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

**4.1.1** **සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනය විසින් 2017-2022 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම තුල විද්‍යාගාර පහසුකම් වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරකමක් ඇතුළත් කර නොතිබූ අතර ඒ හේතුවෙන් ප්‍රමාණ සමීක්ෂණය, කෘෂි යාන්ත්‍ර තාක්ෂණය සහ ඉදිකිරීම් තාක්ෂණය සඳහා වූ විද්‍යාගාර මෙතෙක් සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා සුදුසු පරිදි සකස් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද නියමිත පරිදි විද්‍යාගාර සකස් කර නොතිබීම හේතුවෙන් විද්‍යායතනය වෙත ලබා දී තිබූ රු. 59,530,922 ක් වටිනා පුහුණු උපකරණ 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම නිශ්කාර්යව පැවතුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී ඉටුකිරීමට අපේක්ෂිතව තිබූ රු.මිලියන 8.5 කට අදාල ප්‍රසම්පාදන කාර්යයන් ඉටු කර නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්ම කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.1.2** **ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික වෘත්තීය සුදුසුකම් 5,6,7 මට්ටමේ පාඨමාලා හා ඒ සමාන මට්ටම්වල වෙනත් තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීමේ අරමුණින් 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලිය යටතේ මෙම විද්‍යායතනය පිහිටුවා තිබුණි. කෙසේ වුවද පාඨමාලා ආරම්භ කර වර්ෂ දෙකක් ඉක්මවා ගොස් තිබුණද එම අරමුණු ඉටුකරගත හැකි වන පරිදි පාඨමාලා සංවර්ධනය කර ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් විද්‍යායතනය විසින් පවත්වනු ලබන පාඨමාලා 06 ක් සම්බන්ධයෙන් 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් සහිත පාඨමාලා පැවැත්වීම සඳහා පාඨමාලා ප්‍රතීතනය කිරීම සිදුකල යුතු වුවද මෙතෙක් පාඨමාලා ප්‍රතීතනය කර නොතිබුණි.

(ආ) (i) 2017 වර්ෂයේ පළමු බාණ්ඩයේ පදනම් අදියරට අදාලව නිකුත් කරන ලද විභාග ප්‍රතිඵල අනුව, පාඨමාලා 05 කට අදාලව විෂයයන් 09 ක් සඳහා සිසුන්ගේ සමත්වීමේ ප්‍රතිශතය සියයට 30 සිට සියයට 63 දක්වා වූ පරාසයක පැවති අතර ඊට හේතු වූ කරුණු පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ii) පාඨමාලා හදාරන සිසුන් 153 ක් පළමු කාණ්ඩයේ පදනම් විභාගයේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය (Occupational Safety & Health) යන විෂය සඳහා පෙනී සිට ඇති අතර ඉන් සියයට 73 ක ප්‍රතිශතයක් අසමත් හෝ දුර්වල සාමාර්ථ ලබා තිබුණි. නිසි පූර්ව ඇගයීමකින් තොරව දේශන සඳහා බාහිර දේශකයින් බඳවාගෙන තිබීම හේතුවෙන් සිසුන්ගේ ප්‍රතිඵල පහත වැටී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) සංයුක්ත සැලැස්ම යටතේ දක්වා තිබූ සියලුම පාඨමාලා සඳහා ප්‍රතීතනයන් ලබා ගැනීම, වඩු කාර්මික වැඩ බිමක් ඉදි කිරීම, ආරක්ෂිත වැටක් ඉදි කිරීම හා කාර්යාල භූමිය අංශ වලට වෙන් කිරීම යන කාර්යයන් 2017 වර්ෂයේදී ඉටුකිරීමට අපේක්ෂිතව තිබූ නමුත් එකී කාර්යයන් ඉටු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනය පවත්වාගෙන යන ජාතික තරුණ සේවා සභාවට අයත් අක්කර 5ක ඉඩම මෙම වාර්තාවේ දින වන විටත් විද්‍යායතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පානීය ජලය සම්බන්ධයෙන් විද්‍යායතනය මුහුණ දී ඇති ගැටළු සහගත තත්ත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී නල ළිඳක් තැනීමට කටයුතු කර තිබූ අතර ඒ සඳහා රු.315,380 ක් වැය වී තිබුණි. එහෙත් එයද අසාර්ථක වී තිබූ අතර මෙතෙක් පානීය ජලය පිළිබඳ ගැටළුව නිරාකරණය කරගෙන නොතිබුණි.

(ඇ) සහකාර පුස්තකාලාධිපති තනතුර සඳහා 2015 ජනවාරි 01 දින නිලධාරියෙකු බඳවාගෙන තිබුණද, 2017 ජනවාරි 23 දින සිට එම නිලධාරියා වැඩබලන සහකාර ලේඛකාධිකාරී තනතුරට පත් කර තිබීම හේතුවෙන් පුස්තකාලයේ රාජකාරී ඉටු කිරීමට නොහැකි වී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ සිසුන්ට පුස්තකාල පොත් නිකුත් කර නොතිබුණි.

(ඈ) විද්‍යායතනය මගින් පවත්වන පාඨමාලා 6 අතුරින් පාඨමාලා 3 ක් වන ඉසව් කළමනාකරණය, ආගන්තුක සත්කාර කළමනාකරණය, සංචාරක හා සංචරණ කළමනාකරණය සඳහා සුදුසු පොත් පුස්තකාලය තුල නොතිබීම නිසා එම පාඨමාලා හදාරන සිසුන්ගේ පුස්තකාල භාවිතය දුර්වල මට්ටමක පැවති අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) විද්‍යායතනය විසින් පිළියෙල කරන ලද අධ්‍යයන කාල සටහන තුල ඒ ඒ කාණ්ඩ සඳහා සිසුන්ගේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට සැලසුම් කල කාලපරිච්ඡේදයන් ඇතුළත් වී නොතිබුණු අතර 2017 පදනම් අදියරේ විභාග පවත්වා මාස 03 ක් ඇතුලත පිළිතුරු පත්‍ර පරීක්ෂා කර අවසන් ප්‍රතිඵල තහවුරු කර තිබුණද එම ප්‍රතිඵල කමිටුව වෙත ඉදිරිපත් කර සිසුන් වෙත නිකුත් කිරීමට මාස 07 කට වැඩි කාලයක් ගතවී තිබුණි.

(ඊ) අංක 5CD415FOMW සහ 5CD4092RGD දරන hp වර්ගයේ ලැප්ටොප් පරිගණක දෙකක් නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය විසින් 2015 වර්ෂයේ දී විද්‍යායතනයට ලබා දී තිබූ නමුත් විද්‍යායතනය සතුව එවැනි ලැප්ටොප් 2ක් නොතිබුණු අතර ඒ වෙනුවට අංක NXML TSG00850308AE13400 දරන Acer වර්ගයේ ලැප්ටොප් පරිගනකයක් පමණක් පැවති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් වූ ගැටළුව මෙතෙක් නිරාකරණය කරගෙන නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනය පාඨමාලා 6 ක් පවත්වාගෙන යන නමුත් 2018 මාර්තු 18 දින වනවිටත් කථිකාචාර්යවරු 05 දෙනෙකු පමණක් බඳවාගෙන තිබූ අතර පාඨමාලා සඳහා ප්‍රමාණවත් කථිකාචාර්යවරුන් සංඛ්‍යාවක් බඳවා ගෙන නොතිබීම හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.2,151,700 ක මුදලක් වැය කිරීමට සිදුව තිබුණි. තවද, අනුමත කාර්ය මණ්ඩලය තුළ ප්‍රදර්ශක තනතුරු 05 ක් පැවතියද මෙතෙක් බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විද්‍යායතනයේ බඳවාගැනීම් පරිපාටියට අනුව, සාමාන්‍ය උපාධියක් (General degree) සහිත කථිකාචාර්යවරුන් බඳවාගැනීමේදී උපාධි සුදුසුකම සමග වසරක පශ්චාත් උපාධියක් (Masters Degree) හා උපාධි සුදුසුකමට පසු ලබාගත් වසර 05ක වෘත්තීය පළපුරුද්දක් හෝ ආචාර්ය උපාධි සුදුසුකම නොමැතිනම් උපාධි සුදුසුකමට පසු ලබාගත් වසර 08ක වෘත්තීය පළපුරුද්දක් තිබිය යුතුය. එහෙත් ඉහත සුදුසුකම් සපුරා නොතිබියදී කෘෂි යාන්ත්‍ර තාක්ෂණය හා ඉදිකිරීම් තාක්ෂණය පාඨමාලා සඳහා ආධුනික කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඇ) ප්‍රමාණ සමීක්ෂණය පාඨමාලාව සඳහා 2017 මැයි 04 දින බඳවාගෙන තිබූ ආධුනික කථිකාචාර්යවරිය විදේශ විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් (General degree) ලබා තිබූ අතර බඳවාගැනීමේ පටිපාටියේ 5.1.3 ඡේදය අනුව, උපාධිය සමග පර්යේෂණයක් සහිතව වසර 02ක පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුවිය. එහෙත් මෙම කථිකාචාර්යවරියට පශ්චාත් උපාධි සුදුසුකම් ඇති බවට තොරතුරු අනාවරණය නොවූ අතර අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබියදී පත්වීම් ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2017 අගෝස්තු 24 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ලිපිය හා එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාලව විද්‍යායතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ලඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුවක් පිහිටුවා මාස 3 කට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

**7.** **පද්ධති හා පාලනයන්**

**-----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
| --- | --- |
| (අ) වත්කම් කළමනාකරණය | වත්කම් ගිණුම්ගත නොකිරීම හා ලේඛන පවත්වා නොගැනීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩල බඳවා ගැනීම් විධිමත්ව සිදු නොකිරීම හා පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම. |